සැ. යු.-2015.03.20 දින පළවූ අංක 1,907 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,908 - 2015 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2015.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 416 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 421 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

413- B 80932—5,302 (2015/03)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 අප්‍රේල් මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මාර්තු මස 09 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | මීනුවන්ගොඩ | හොරම්පැල්ල කොට්ඨාසයේ උප්පැන්න මරණ හා උතුරු අළුත්කුරු කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

03-728

## සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනයේ පුරප්පාඩු වී ඇති කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීම

සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනයේ පුරප්පාඩු වී පවතින සිංහල, පාලි, ඉංග්‍රීසි අධ්‍යාපන මූලධර්ම, සෞඛ්‍ය විද්‍යාව යන විෂයයන් සඳහා කථිකාචාර්යවරුන් බඳවා ගැනීම පිණිස පහත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවේ.

02. මෙම තනතුරු "පිරිවෙන් අභ්‍යාස ආයතන කථිකාචාර්ය" නමින් හැඳින්වේ. මේ සඳහා සුදුසුකම්ලත් පැවිදි හා ගිහි අයට ඉල්ලුම් කළ හැකිය.

03. අයදුම්කරුවන් පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු ය.

(ii) අදාළ විෂයය ක්ෂේත්‍ර පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් හෝ ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ පණ්ඩිත උපාධිය හෝ අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රමාණවත් සුදුසුකමක් ලෙස පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය විසින් පිළිගනු ලබා සහතිකයක් හෝ ලබා තිබීම හා උපාධිධාරියෙකු නම් පශ්චාත් උපාධියක් ලබා ඇති හා වසර 07ක ඉගැන්වීමේ පළපුරුද්දක් ලත් පිරිවෙන් අධ්‍යාපන පනත යටතේ අනුමත පිරිවෙනක පරිවෙණාචාර්යවරයෙකු වීම.

(iii) අයදුම්කරු ඉල්ලුම් කරන විෂයය සම්බන්ධ ප්‍රවීණතාව සහතික කළ යුතු ය.

පන්ති සාමර්ථයක් සහිත උපාධිය ලබා තිබීම හෝ පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමාව සම්මාන සාමර්ථය සහිතව ලබා තිබීම කෙරෙහි විශේෂත්වයක් දක්වනු ලැබේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති අය මෙහි දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්පත්‍රයක් සකස් කොට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2015.04.20 දිනට පෙර එවිය යුතු ය. අසම්පූර්ණ හෝ අපැහැදිලි ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කෙරේ, ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ගුරු අභ්‍යාස ආයතන කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය.

උපාලි මාරසිංහ,
අධ්‍යාපන ලේකම්.

2015 මාර්තු මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :————.

03. තැපැල් ලිපිනය :————.

04. දුරකථන අංකය :————.

05. උපන් දිනය : වර්ෂය :———. මාසය :———. දිනය :———.

06. ජා. හැ. අංකය :————.

07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවු. :————. මාස :————. දින :————.

08. විවාහක/අවිවාහක බව :————.

09. ජාතිය :————.

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? :————.

එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන් ද යන වග :——.

11. අධ්‍යාපන සුදුසුකම් :————.

12. වෘත්තීය සුදුසුකම් :

(i) දැනට දරන තනතුර :————.
(ii) එම තනතුරට පත් වූ දිනය :————.
(iii) එම පත්වීමේ ස්වභාවය : (ස්ථිර/ අනියම්/ තාවකාලික/ ආදේශක/ කොන්ත්‍රාත්)

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර හෝ පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

03-726

---

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා වන (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ 'අධ්‍යක්ෂ ජනරාල්' යන පදයෙන් අදහස් කෙරෙන්නේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ය.

2. ව්‍යුහගත පරීක්ෂණය - ව්‍යුහගත පරීක්ෂණය පැවැත්වෙන දිනය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 |
| අතිරේක වෘත්තීය පළපුරුද්ද | 30 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 |
| එකතුව | 100 |

3. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව :
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා (කොන්ත්‍රාත් පදනම මත) පුරප්පාඩු 03ක් පිරවීමට කටයුතු කරනු ඇත.

4. පත්වීම ක්‍රියාත්මක වන දිනය :
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

5. *සේවා කොන්දේසි.*—රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, 2014.05.09 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) තනතුරු සඳහා වන (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම බඳවා ගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත් ව තෝරාගනු ලබන අපේක්ෂකයකු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සංස්කාරක තනතුරට පත් කරනු ලැබේ.

6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත්වන හා/හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

7. මාසික දීමනාව : රුපියල් 25,000 කි.

8. සුදුසුකම් : අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයවන විට,

(i) අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ උපාධියක් ලබා තිබීම.

(ii) වෘත්තීය සුදුසුකම් : තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ප්‍රකාශන සංස්කරණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

(iii) පළපුරුද්ද : රජයේ ලියාපදිංචි ප්‍රකාශන ආයතනයක තනතුරට අදාළව ලිපි සංස්කරණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

(iv) කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(v) වෙනත් (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන්වන සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

9. වයස : අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 55

10. අයදුම් කිරීමේ ක්‍රමය :

(*a*) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර ද, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(*b*) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුලපන මාවත, කොළඹ 05 යන ලිපිනයට 2015.04.24 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතුය. අයදුම්පත් බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව "රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සංස්කාරක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත වන බඳවා ගැනීම" යන්න සටහන් වී තිබිය යුතුය. එදිනට පසු ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

(*c*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

11. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද,

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

2015 මාර්තු මස 10 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
අංක 163, කිරුළපන මාවත, කොළඹ 05

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා යි.)

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා වන (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

1.0 මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 පෞද්ගලික තොරතුරු :

(1) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්
:————.
උදාහරණ : SILVA A. B.

(2) සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

(3) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

(4) පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

(5) ස්ත්‍රී/පුරුෂභාවය : පුරුෂ - 0 අදාළ අංකය කොටුව තුළ ලියන්න.
ස්ත්‍රී - 1

(6) විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 අදාළ අංකය කොටුව තුළ ලියන්න.
විවාහක - 2

(7) ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)

අදාළ අංකය කොටුව තුළ ලියන්න.

(8) ජාතික හැඳුනුම්පත් අංකය

(9) උපන් දිනය : වර්ෂය මාසය දිනය

(10) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවු මාස දින

(11) දුරකථනය අංකය (තිබේ නම්) :

3.0 අධ්‍යාපන සුදුසුකම් :

| විශ්ව විද්‍යාලය | ලබා ඇති උපාධිය | උපාධිය වලංගු වන දිනය | විෂයයන් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

4.0 වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | ලබා ඇති ඩිප්ලෝමාව | ඩිප්ලෝමාව වලංගු වන දිනය | කාලය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5.0 පළපුරුද්ද :————.

6.0 අයදුම්කරුගේ සහතිකය

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

7.0 *අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ............ දින මා ඉදිරියේ දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

__________,
අත්සන සහතික කරන ලද,
නිලධාරියාගේ අත්සන.

නම :__________.
පදවි නාමය :__________.
ලිපිනය :__________.
දිනය :__________.

(අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 22,935 ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

03-891

---

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ රූ රටා සංස්කාරක තනතුර සඳහා වන (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ රූ රටා සංස්කාරක තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ 'අධ්‍යක්ෂ ජනරාල්' යන පදයෙන් අදහස් කෙරෙන්නේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ය.

2. ව්‍යුහගත පරීක්ෂණය - ව්‍යුහගත පරීක්ෂණය පැවැත්වෙන දිනය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 |
| අතිරේක වෘත්තීය පළපුරුද්ද | 30 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 |
| එකතුව | 100 |

3. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව :
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ රූ රටා සංස්කාරක තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) පුරප්පාඩු 01ක් පිරවීමට කටයුතු කරනු ඇත.

4. පත්වීම ක්‍රියාත්මක වන දිනය :
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

5. සේවා කොන්දේසි - රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද, 2014.05.08 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ රූ රටා සංස්කාරක තනතුර සඳහා වන (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම බඳවා ගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලටද යටත් ව තෝරාගනු ලබන අපේක්ෂකයකු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ රූ රටා සංස්කාරක තනතුරට පත් කරනු ලැබේ.

6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

7. මාසික දීමනාව : රුපියල් 25,000 කි.

8. සුදුසුකම් : අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට,

(i) *අධ්‍යාපන සුදුසුකම්.*—විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ උපාධියක් ලබා තිබීම.

(ii) *වෘත්තීය සුදුසුකම්.*—තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ප්‍රකාශන රූ රටා සංස්කරණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

(iii) *පළපුරුද්ද.*—රජයේ ලියාපදිංචි ප්‍රකාශන ආයතනයක තනතුරට අදාළව රූ රටා සංස්කරණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

(iv) *කායික සුදුසුකම්.*—සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(v) වෙනත් (i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් වන සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

9. වයස : අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 55

10. අයදුම් කිරීමේ ක්‍රමය :

(a) අයදුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර ද, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(b) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුලපන මාවත, කොළඹ 05 යන ලිපිනයට 2015.04.27 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතුය. අයදුම්පත් බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව "රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ රූ රටා සංස්කාරක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත

වන බඳවා ගැනීම" යන්න සටහන් වී තිබිය යුතුය. එදිනට පසු ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

(c) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

11. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද,

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

2015 මාර්තු මස 10 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
අංක 163, කිරුළපන මාවත, කොළඹ 05

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා යි.)

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ රූ රටා සංස්කාරක තනතුර සඳහා වන (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

1.0 මාධ්‍යය
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 පෞද්ගලික තොරතුරු

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————. උදාහරණ : SILVA A. B.

2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.5 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 අදාළ අංකය කොටුව තුළ ලියන්න.
ස්ත්‍රී - 1

2.6 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 අදාළ අංකය කොටුව තුළ ලියන්න.
විවාහක - 2

2.7 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)

අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.8 ජාතික හැඳුනුම්පත් අංකය

2.9 උපන් දිනය :

වර්ෂය මාසය දිනය

2.10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවු මාස දින

2.11. දුරකථනය අංකය (තිබේ නම්) :

3.0 අධ්‍යාපන සුදුසුකම් :

| විශ්ව විද්‍යාලය | ලබා ඇති උපාධිය | උපාධිය වලංගු වන දිනය | විෂයයන් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

4.0 වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | ලබා ඇති ඩිප්ලෝමාව | ඩිප්ලෝමාව වලංගු වන දිනය | කාලය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5.0 පළපුරුද්ද :————.

6.0 අයදුම්කරුගේ සහතිකය

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

7.0 අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ............ දින මා ඉදිරියේදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන ලද,
නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

(අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරයෙකු හෝ රු. 22,935 ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

03-892

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති තනතුරේ - III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2015)

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2015.03.27 වැනි දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. (ඒ අනුව අයැදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ 1997.03.27 දින හෝ ඊට පෙර හා 1985.03.27 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණි.) අයැදුම්පත් භාරගන්නා අවසන් දිනය 2015.04.27 වේ. සියළුම අයැදුම්පත් එදිනට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කිසිම අයැදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ නොකළ යුතු ය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාදවී ලැබෙන අයැදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් තම අයැදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් නියමිත දිනට පෙර එවිය යුතු ය. මෙම විභාගය පැවැත්වීම සඳහා විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂිත නගර හා නගර අංක 1 වැනි උපලේඛනයේ දක්වා ඇත. ඉල්ලුම්පත්‍රයේ ඉහළ ශීර්ෂයේ මෙම නගර අංක ලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. එහෙත් විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති නගරවල අයැදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කොට නොමැත්තේ නම්, විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

### I වැනි උපලේඛනය

**විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

02. *අයැදුම්පත් කැඳවනු ලබන තනතුර :*

දුම්රිය ස්ථානාධිපති III ශ්‍රේණිය

03. *තනතුරේ රාජකාරි ස්වභාවය :*

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ පවත්නා දුම්රිය ස්ථානයන්හි කාර්යයන්ට අදාළව දුම්රිය සාමාන්‍යාධිකාරිගේ නියෝජිතයා ලෙස කටයුතු කරමින් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නිශ්චිතව පවරාදෙනු ලබන පිරිස් පාලනය, මූල්‍ය හා වාණිජ කටයුතු, සම්බන්ධීකරණ කාර්යයන්, මෙහෙයුම් කටයුතු, ප්‍රවේශපත්‍ර හා ගිණුම් කටයුතු ඇතුලු බහුකාර්යය ස්වරූපයේ කාර්යයන් සහ අධීක්ෂණ කාර්යයන් ඉටු කරන නිලධර ගණයකි.

04. *වැටුප් පරිමාණය :*

දුම්රිය ස්ථානාධිපති - III පෙළ සඳහා අදාළ වන වැටුප් පරිමාණය (MN- 3-2006- A) රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 වේ.

05. (අ) *අධ්‍යාපන සුදුසුකම් :*

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් 06කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) සමත් වී තිබීම;

*සහ*

(ii) අ. පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) කින් සමත් වී තිබීම)

(ආ) *කායික සුදුසුකම් :*

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.
(ii) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
(iii) උස අඩි 05 අඟල් 04කට හා පපුව අඟල් 32ට නොඅඩු වීම.
(iv) 6 x 6 අක්ෂි දෘෂ්ඨි පරීක්ෂණයකින් සමත් වීම.

(ඇ) *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යුක්ත විය යුතු ය.

(iii) අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.

*සටහන.*—මෙම නිවේදනය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන දිනට ඉහත සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

*06. බඳවා ගැනීමේ ක්‍රමය :*

ඉහත (05) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වා ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ. අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවැති පුරප්පාඩු පමණක් පුරවන අතර, පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

07. *බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පරිපාටිය :-*

(i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

(ii) *විභාග ක්‍රමය :*

(අ) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.

(ආ) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (05) යටතේ සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(iii) *විභාගයේ විෂයයන් :*

(අ) භාෂා හැකියාව

(ආ) අභියෝග්‍යතා පරීක්ෂණය

(iv) *විෂය නිර්දේශය :*

(අ) භාෂා හැකියාව

කාලය පැය 1 1/2 යි. ලකුණු 100 යි.
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
එක් එක් කොටස සඳහා සමාන ලකුණු හිමි වේ.
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

I වැනි කොටස

මෙම කොටසට රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත් වේ.

II වැනි කොටස

භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුණු පාඨයන් කිහිපයකින් දෙවැනි කොටස සමන්විත වේ. මෙම පාඨයන් ආශ්‍රයෙන් යටින් ඉරි ගැසූ පදවල අර්ථය තනි වාක්‍යයකින් ප්‍රකාශ කරන ලෙස හෝ ඒ පිළිබඳ විවරණාත්මක සටහන් ලියා දක්වන ලෙස හෝ විකල්පයන් බාණ්ඩයකින් ඉතාමත්ම උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්නය සඳහා පිළිතුරු කිහිපයක් අතරින් නිවැරදි පිළිතුර තෝරා දක්වන ලෙස අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ.

(ආ) *අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 01 යි. ලකුණු 100 යි.*

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(v) *තේරීම් පරිපාටිය :*

එක් එක් විෂයයකින් ලකුණු 50%ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් විභාගය සමත් වූ අය සේ සැලකෙන අතර, මෙම විභාගයෙන් විෂයයන් දෙකෙන්ම වැඩි ලකුණු ලබා සමත්වන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමක් සිදු කරනු නොලැබේ. අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව දුම්රිය ස්ථානාධිපති - III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පත්කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලබන්නේ ඉහත 06 යටතේ දක්වා ඇති කරුණුවලට යටත්ව විභාගයේ ඉහලම ලකුණු ලබා ඇති කුසලතා අනුපිළිවෙලට අනුව ය.

07. *අයැදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස් :*

(i) අයදුම්පත A 4 (යතුරුලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු ය.

(අයදුම්පත තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි)

අයදුම්පතේ—

1 වැනි පිටුවේ අංක 01 සිට 03 තෙක් කරුණු ද,

2 වැනි පිටුවේ අංක 04 සිට 09 තෙක් කරුණු ද,

3 වැනි පිටුවේ අංක 10 සිට 11 තෙක් කරුණුද,
4 වැනි පිටුවේ අංක 12 සහ 13 අත්සන සහතික කිරීම හා දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකයද ඇතුළත් විය යුතුය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ii) අදාළ විභාගය සඳහා විභාග ගාස්තුව රු. 750කි. එය විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයකින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම ලදුපතෙහි ඡායා පිටපත් ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයට මුදල් ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. තවද විභාග

ගාස්තු ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති තනතුරේ - III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2015)" යන්න සහ ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය සඳහන් කරන්න.

(iv) බාහිර අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම : රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු, රා. ප. ච. 6/2006 අනුව රු. 19,755 ක මාසික ආරම්භක ඒකාබද්ධ වැටුපක් හෝ ඊට වැඩි ආරම්භක වැටුපක් හෝ ලබන රජයේ නිලධාරියකු විසින් සිදු කළ යුතු ය.

(v) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. මොවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවීම අනිවාර්ය වේ.

(vi) නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම් පත්‍ර ඉදිරිපත්කර ඇති මෙම නිවේදනයේ සඳහන් වයස් කාණ්ඩයට ඇතුළත්වන අයැදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් එවනු ඇත. **තරග විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.** අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(vii) අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම් පත්‍රයෙහි පිටපතද, ගෙවන ලද විභාග ගාස්තුවට අදාල ලදුපතෙහි පිටපත ද, ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, අයැදුම් කරන ලද විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකයද සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර සමඟ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින්ම යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

(viii) "විභාග අපේක්ෂකයන් විභාගයට පෙර තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කරවා ගත යුතුය. විභාගයට පළමුවෙන්ම පෙනී සිටින දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත."

(ix) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාග වලදී අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි.

(x) **අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.**

(xi) විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවේ. *ගැසට්* නිවේදනයේ 7. V ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව සකස්කළ ප්‍රතිඵල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරි වෙත ලබා දෙනු ඇත. ප්‍රතිඵල ලේඛනයට ඇතුළත් කළයුතු සමත් අයදුම්කරුවන් සංඛ්‍යාව පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා දුම්රිය සාමාන්‍යාධිකාරිගේ ඉල්ලීම මත තීරණය වනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www. results.exam. gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම හෝ විභාග දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ඇත.

09. *සේවා කොන්දේසි* :

දුම්රිය ස්ථානාධිපති - III තනතුරට බඳවා ගනු ලබන නිලධාරීන් වසර 03ක පරිවාස කාලයකට යටත් වනු ඇත. දුම්රිය ස්ථානාධිපති - III තනතුරට පත් වූ දින සිට වසර 03ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතුය. පරිවාස කාලය තුළ දුම්රිය ආදර්ශ පාසලේ මාස 06ක කාලයක් දුම්රිය ස්ථානාධිපති සේවයට අදාළ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. පුහුණුව අවසානයේ දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතුය.

10. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තව දුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් වසර 05ක් තුළ ලබා ගත යුතුය. එම ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග, දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

11. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

වී. අමරතුංග,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2015 මාර්තු මස 10 වැනි දින,
කොළඹ 10.
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේ දී ය.

(මේ අනුව A - 4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයැදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයැදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

ආදර්ශ අයැදුම්පත්‍රය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ, දුම්රිය ස්ථානාධිපති තනතුරේ - III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2015)

Open Competitive Examination for Recruitment to the Post of Station Master Grade III in Sri Lanka Railway Department - 2014 (2015)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| | |
|---|---|
| විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය ඃ<br>සිංහල - 2<br>දෙමළ - 3<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) | |
| පුරවැසිභාවය ඃ<br>පරම්පරාවෙන් -1<br>ලියාපදිංචි වීමෙන් -2<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) | |

| විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය | නගරය | නගර අංකය |
|---|---|---|
| 1 වැනි කැමැත්ත | | |
| 2 වැනි කැමැත්ත | | |
| විභාග නිවේදනයේ ආරම්භක ඡේදය බලන්න. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | | |

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
(උදා. : GUNAWARDHANA M. G. B. S. K.)

02. මුල්'කුරුවලින් හැඳින්වෙන නම් :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

03. ස්ථිර ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී — 1

පුරුෂ — 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජන වර්ගය :

(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

සිංහල - 1/ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2/ඉන්දියා ද්‍රවිඩ - 3/මුස්ලිම් - 4/බර්ගර් - 5/ මැලේ - 6

06. ජාතික හැඳුනුම්පත් අංකය ඃ

07. පදිංචිය :————.

(i) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————. එහි අංකය :

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

(iii) දිස්ත්‍රික්කය :————.

08. උපන් දිනය : වර්ෂය මාසය දිනය

2015.04.27 දිනට වයස : අවුරුදු මාස දින

09. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (සා. පෙළ.)

විභාග අංකය:————. වර්ෂය :————.

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| (v) | | |
| (vi) | | |
| (vii) | | |
| (viii) | | |

(ii) අ. පො. ස. (උසස් පෙළ) :

විභාග අංකය :————. වර්ෂය:————.

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :————.

(අදාළ කොටුව තුළ " x " ලකුණ යොදන්න)

ඔව් නැත

11. අයැදුම්කරුගේ සහතිකය ඃ

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හා තනතුර සඳහා තෝරා ගැනීමෙන් පසු ඉහත කරුණු, අනාවරණය වුවහොත් තනතුර සඳහා කරන ලද පත්වීම අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙලිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවාද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) ………… දින ………… තැපැල් කාර්යාලයට රු. 750ක් ගෙවා ලබා ගත් අංක …… දරන ලදුපත මේ සමග අමුණා ඇත.

| |
|---|
| ලදුපත එහි එක් දාරයකින් නොගැලවෙන සේ අලවන්න. |
| (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

—————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :—————.

12. අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන …………………… මහතා මම පුද්ගලිකව හඳුනමි. ඔහු ……………… දින ඉහත අත්සන මා ඉදිරිපිටදී තැබූ බව ද සහතික කරමි.

—————,
සහතික කරන අයගේ අත්සන.

දිනය :—————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :—————.

තනතුර :—————.

ලිපිනය :—————.

(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

13. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයැදුම්පත ඉදිරිපත් කර ඇති ……………………… මහතා ………………… දෙපාර්තමේන්තුවේ/ආයතනයේ * ………… දින සිට ………… දින දක්වා ……………………… වශයෙන් සේවය කර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත/ඇත.* ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති III ශ්‍රේණිය සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන්* මුදා හැරීමට හැකි/නොහැකි* බවත් දන්වනු කැමැත්තෙමි. (*අදාළ නොවන වචන කපා හරින්න.)

—————,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

03-727

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2015)

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, රෙජිස්ට්‍රාර් සේවය III පංතියේ II ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීමට මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය :*

2015 ජූලි මාසයේදී විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ඉහළ ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ. මෙම විභාගය පහත සඳහන් නගර වලදී පැවැත්වේ. එම නගර සහ නගරවලට අදාළ නගර අංක පහත පරිදි වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි හෝ මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක ගේ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් විභාගය කොළඹ දී පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| යාපනය | 10 |
| අම්පාර | 16 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුරය | 24 |

මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

03. *සේවා කොන්දේසි :*

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලට ද, මෙහි පහත සඳහන් කොන්දේසි වලට ද යටත්ව, රෙජිස්ට්‍රාර් සේවය III පංතියේ II ශ්‍රේණිය තනතුරු සඳහා බඳවාගනු ලැබේ.

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය. තේරී පත්වන අයදුම්කරුවන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ රාජ්‍ය සේවයේ පොදු කොන්දේසිවලට ද, මෙතෙක් නිකුත් කර ඇති හා කළින් කළ නිකුත් කරනු ලබන නියෝග, රෙගුලාසි වලට ද යටත් විය යුතුය. එමෙන්ම ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩයේ පරිච්ඡේදයන්වලට ද යටත් විය යුතුය.

(iii) සේවයට පත්කරන නිලධාරියකු පත්වීම් බලධාරියා තීරණය කරන පරිදි පුහුණුවකට යටත් විය යුතුය.

(iv) රාජ්‍ය සේවයට ඇතුළුවන නවක නිලධාරීන් අවුරුදු තුන (03)ක පරිවාස කාලයකට යටත් වන්නේය.

(v) රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් වර්ෂයක් ගතවන තුරු වැඩ බැලීමේ පදනම මත පත්කරනු ලැබේ.

(vi) තනතුරකට පත්වී වසර තුනක් ගතවීමට පෙර, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත විභාගය සමත් විය යුතුය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් නොකරනු ලැබේ.

(vii) තනතුර ස්ථිර කිරීමෙන් පසු රාජ්‍ය සේවයෙන් බඳවා ගත් නිලධාරීන්ට පෙර සේවයේ සාමාජිකත්වය අහිමිවන අතර, එම සේවයට ආපසු යාමේ අයිතිය ද නැතිවනු ඇත.

04. *වැටුප් පරිමාණය* :

MN-5-2006(A)
රු. 16,720-10x320-11x365-15x450-රු. 30,685
6/2006 (iv) චක්‍රලේඛය

05. *වයස් සීමාව* :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය. ("ඒ අනුව 1994.04.24 දිනට හෝ ඊට පෙර හා 1980.04.24 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා සුදුසුකම් ඇත.")

06. සුදුසුකම්.— 2015 අප්‍රේල් මස 24 වැනි දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි. :

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු වීම,

*හෝ*

(iii) නීති විද්‍යාලයේ අවසාන නීති විභාගයෙන් සමත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී ඇති නීතිඥවරයෙකු වීම.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*—අයදුම්පත් කැඳවා සුදුසුකම් සහිත අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතුය. එසේ ලබාගත් අයදුම්කරුවන් තෝරා, ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව, ඉහළම ලකුණු ලැබූ අය අනුපිළිවෙලින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සහතික පත් පරීක්ෂා කිරීමට පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබයි.

08. *විභාග ගාස්තුව* :

විභාග ගාස්තුව රු. 600 කි.

මෙම විභාග ගාස්තුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පළමුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම් පත්‍රයෙහි නියමිත ස්ථානයෙහි නොගැළවෙන ලෙස ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට ඈඳා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල ඉල්ලුම්පත් වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම්පත් වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද යොදන්න. එය කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින්, 8 1/2" x 12" ප්‍රමාණයේ කඩදාසියක සකස් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 6 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස සකස් කරන්න. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේම සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍ර විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න අයදුම්කරු විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩිදුරටත් දන්වමි. අයදුම්පත්‍රයෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම, අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් ම විය යුතුය.

(ඇ) ඉල්ලුම්පත් 2015.04.24 වැනි දින හෝ එදිනට පෙර, ලියාපදිංචි තැපෑලෙන් විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයෙහි වමත්පස ඉහළ කෙළවරේ "රෙජිස්ට්‍රාර් සේවය III පංතියේ II ශ්‍රේණිය තනතුරුවලට බඳවා ගැනීමේ තරග විභාගය - 2014(2015)" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*සටහන* : රජයේ සේවයේ/පළාත් පාලන සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම් පත්‍රය, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබීමට ඉඩ ඇත. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඉ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. අදාළ විභාග ගාස්තුව ගෙවා, නිසිලෙස ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම ඉල්ලුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර, විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපැල් මගින් එවනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

10. *විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීම* :

(i) විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු, විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) සෑම විභාග අපේක්ෂකයකු ම තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාග අපේක්ෂකයින් විසින් අනුගමනය කළ යුතු පොදු නීති රීතිවලට යටත්විය යුතු ය.

(iii) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පුකර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් ඕනෑම එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත.

(ii) නිකුත් කරන ලද දිනය, විභාගය පවත්වන දිනයට අවුරුදු 03කට කලින් නොවන පරිදි වන වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

12. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

(අ) අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. මෙම රෙගුලාසිවලින් සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

14. *විභාග පරිපාටිය* :

(i) මාධ්‍යය :

(අ) සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් එක් මාධ්‍යකින් ඉල්ලුම් කළ හැක.

(ආ) සියලුම අයදුම්කරුවන්, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන් ම සියලුම ප්‍රශ්නපත්‍රවලට පිළිතුරු සැපයිය යුතු ය.

(ඇ) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට කිසිම අපේක්ෂකයකුට ඉඩදෙනු නොලැබේ.

(ii) විෂයයන් සහ විෂයය නිර්දේශය :

විභාගය, පහත සඳහන් විෂයයන් පිළිබඳව ලිඛිත ප්‍රශ්නපත්‍රවලින් සමන්විත වේ.

| *විෂයය* | *විෂයය අංකය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| අභියෝග්‍යතාවය | 01 | පැය 1.00 | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | 02 | පැය 1.00 | 100 | 40 |
| භාෂාව හා රචනය | 03 | පැය 1.00 | 100 | 40 |

**විෂයය නිර්දේශය** :

| *ප්‍රශ්න පත්‍රය* | *විෂයය නිර්දේශය* |
|---|---|
| අභියෝග්‍යතාව<br><br>ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි ප්‍රශ්න 50කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. | අපේක්ෂකයාගේ තර්කානුකූල විශ්ලේෂණ ශක්තිය හා වාචික නොවූ ප්‍රස්තුත ආශ්‍රයෙන් ඉදිරිපත් කෙරෙන තොරතුරු පිළිබඳව වලංගු නියමයන්ට එළඹීමට ඇති හැකියාව හා දැනුම මැනීම පිණිස සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයක්. |
| සාමාන්‍ය දැනීම<br><br>ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි ප්‍රශ්න 50කින් සමන්විත වේ.<br>ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. | ශ්‍රී ලංකාවේ සමාජමය හා සංස්කෘතික රටාව හා ජාතික මෙන්ම අන්තර්ජාතිකව ද වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයක්. |

| ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|
| භාෂාව හා රචනය<br><br>ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. | දෙන ලද මාතෘකා/තේමා ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනීම පිරික්සීම. |

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා කිසියම් අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

2015 මාර්තු මස 27 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2014 (2015)**

Registrar General's Department Open Competitive Examination for Recruitment to the Posts of Registrars Grade II of Class III Registrar Service - 2014(2015)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍ය (සිංහල 2/දෙමළ 3) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) ☐

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි ☐

* *ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය, නගර අංකය සඳහන් කරන්න.*

| | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |

(1) (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා.* GUNAWARDHANA, M. G. B. S. K. :———.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

(2) සම්පූර්ණ ලිපිනය :
(i) ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(3) ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 (කොටුවේ අදාළ අංකය යොදන්න).
පුරුෂ - 0 ☐

(4) විවාහක/අවිවාහක බව : විවාහක - 1 (කොටුවේ අදාළ අංකය යොදන්න).
අවිවාහක -2 ☐

(5) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(6) i. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

ii. 2015.04.24 දිනට වයස : අවු. ☐☐ මාස ☐☐ දින ☐☐

(7) විභාගය සඳහා අයදුම් කිරීමට ඔබ සුදුසුකම් ලබා ඇත්තේ විභාග නිවේදනයේ කුමන ඡේදය යටතේ ද ?
(6 (ii) හෝ 6(iii)) :————.

7.1 6(ii) ඡේදය යටතේ නම්
උපාධිය :————.
සුදුසුකම් සපුරා ඇති දිනය :————.

6(iii) ඡේදය යටතේ නම් :————.
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

(8)

මුදල් කුවිතාන්සිය එහි එක් දාරයකින් මෙහි අලවන්න.
(මුදල් කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගන්න.)

ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තුව ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

(9) අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව සහතික කරමි. විභාග ගාස්තු ගෙවන ලද අංක .............. හා ............ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බව ප්‍රකාශ කරමි. විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ පසු හෝ මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකටත්, පත්වීම ලැබීමෙන් පසු අනාවරණය වුවහොත්, මා වන්දියක් නොමැතිව ධුරයෙන් පහකළ හැකි බවටත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(10) ආදර්ශ අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

ඉහත නම සඳහන් ................. මහතා/මහත්මිය/මෙනවිය මා දන්නා හඳුනන බවත්, අද දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තබන

ලද බවත් සහතික කරමි. තව ද ඔහු/ඇය විභාගයට නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

නම :————.
තනතුර :————.
දිනය :————.
(නිල මුද්‍රාව තබන්න.)

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත විස්තර සඳහන් ........... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
දිනය :————.
(නිල මුද්‍රාව තබන්න.)

03-801

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (2015)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ යොමු අංකය NSCC/6/25/090/SR හා 2011.08.26 දිනැතිව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවය III පංතියේ II ශ්‍රේණියේ නිලධාරීන්ට අනුමත බඳවා ගැනීම් පටිපාටියේ 08 වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අදාළ I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2015 ජූලි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 රෙජිස්ට්‍රාර් සේවය III පංතියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ දී පැවැත්වීමට නියමිත වේ.

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *සුදුසුකම්* .— රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

5.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු ය. එසේ පිළියෙල කරන ලද අයදුම්පත්‍රය අපේක්ෂකයින් විසින් සිය පත්වීම් බලධාරී මගින් 2015.04.24 දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503 කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු බැවින් 2015.04.17 දිනට හෝ ඊට පෙර ඔබගේ අයදුම්පත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය. රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

6.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් ඕනෑම එකක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

7.0 *අයදුම්පත්‍ර* - ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 5.0 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද අංක 6.0 සිට ඉතිරිය ඇති ඡේදයන් අනිත් පිටුවලට ද, ඇතුළත්වන පරිදි "ඒ 4" ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතු ය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම පිරවිය යුතු ය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර එක් අයදුම්කරුවෙක් විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට හෝ පළමුවන වරට පෙනී සිටීමේ දී විභාග ගාස්තු අය නොකෙරේ. එහෙත් ඉන්පසු පෙනී සිටින වාරවල දී පහත සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවිය යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | රු. 400.0 |
| එක් විෂයයක් සඳහා | රු. 200 0 |

එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ අලවා එවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද මුදල ආපසු ලබාගැනීමට හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට හෝ නොහැකිය.

8.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත ද විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත ද අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සහ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් ම විමසා සිටීම ද වඩාත් ඵලදායි වනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

*සටහන* : අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

9.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි ආයතන ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 මෙම විභාගය සිංහල හා දෙමළ යන මාධ්‍යවලින් පැවැත්වේ. අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුනු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැක. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

11.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකි ය. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබාගත යුතුවේ.

12.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙළ කළ යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතු ය.

13.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්, වෙත ලබා දෙනු ඇත. විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකිරීමට කටයුතු කරනු ලැබේ.

14.0 *විභාග පරිපාටිය* : අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

| *විෂයය අංකය* | *විෂයය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණ* |
|---|---|---|---|---|
| 01. | ආයතන කාර්යය පරිපාටිය | පැය 03 | 100 | 40 |
| 02. | ගිණුම් ක්‍රම | පැය 03 | 100 | 40 |

14.1 අදාළ විෂයය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| ආයතන කාර්යය පරිපාටිය | (අ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද III, IV, V, VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XXIV, XXVII සහ XXVIII<br><br>(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති |
| ගිණුම් ක්‍රම | (අ) මුදල් රෙගුලාසි සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, IV, V, VI, VII, VIII<br>(ආ) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ,<br><br>* වැඩ සැපයුම් හා සේවා<br>* භාණ්ඩ/වත්කම් ගණන් තැබීම ආරක්ෂාව හා භාණ්ඩ සමීක්ෂණ |

15.0 මෙම විභාග නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් ම පළකරනු ලබන අතර, එම භාෂා පදමාලා අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පදමාලාව බලාත්මක වන බව සැලකිය යුතු ය. තව ද, මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තීරණය කරනු ඇත.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

2015 මාර්තු මස 27 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (2015)

First Efficiency Bar Examination for the Officers of Grade III Class II of the Registrar Service - 2014(2015)

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය | | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි | |
|---|---|---|---|

(සිංහල 2/දෙමළ 3)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා.* GUNAWARDHANA, M. G. B. S. K. :———————.

1.2 මුලකුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් : (සිංහලෙන්/දෙමළෙන්) :———.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0

4.0 ජාතික හැඳුනුම්පත් අංකය

5.0 ඔබ ඉදිරිපත්වන විෂයය/විෂයයන් :

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| | |
| | |

6.0 දැනට දරන තනතුර :

6.1 තනතුර :————.

6.2 පත්වීම් ලිපියේ අංකය :————.

6.3 රෙජිස්ට්‍රාර් සේවය III පංතියේ II ශ්‍රේණියට පත්වූ දිනය :———.

7.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම ඇති බවත්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත්වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

සටහන .—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

**අත්සන සහතික කිරීම**

මගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ………… මහතා/මහත්මිය/මෙනවිය ………… වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි. තව ද නියමිත විභාග ගාස්තුව ගෙවූ මුදල් කුවිතාන්සිය අලවා ඇති බවද ප්‍රකාශ කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

i. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,

ii. නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

iii. නිලධාරියා/නිලධාරිණිය ……… වතාවට මෙම විභාගයට පෙනී සිටින බවත්,

මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.

03-800

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.